**තවලම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තවලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ---------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ලැබුණු වටිනාකම රු.484,580 ක් වූ පරිගණක හා ඡායා පිටපත් යන්ත්‍රය ගිණුම් ගතකර නොතිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දී මිලදීගත් රු.247,230 ක් වූ පුස්තකාල පොත් වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | මහජන පුස්තකාල සඳහා මිලදී ගත් එකතුව රු.90,000 ක් වූ කබඩ් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි. | විගණන ගාස්තු ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ අත රැඳවුම් තැන්පතු රු.278,389 ක් ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.804,345 ක වෙනසක් විය. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | වෙළඳ සංකීර්ණ බදු දීමේ දී ලබාගන්නා ලද ඇප තැන්පත් රු.518,000 ක් ජංගම බැරකම් ලෙස දැක්වීම වෙනුවට ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,361,903 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමාන - තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව වීරපාන මැද ඕවිට ක්‍රීඩාංගනය හා බටහේන සතිපොල සංවර්ධනය කිරීම වෙනුවෙන් ස්කැෆෝල්ඩ් යන්ත්‍රයක් සඳහා රු.84,840 ක් ගෙවා තිබුණි. | ඇස්තමේන්තු අනුමැතිය ලබාගෙන ගෙවීම් කළ යුතු වේ. | මුදල් කමිටුවේ අනුමැතිය ලබා ගතිමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට නිරවුල් නොවී ඉදිරියට ගෙන එමින් පවතින රු.16,477 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ත් පියවර ගෙන නොතිබුණි. | වැරදි හඳුනාගෙන ගිණුම් ගැලපීම කළ යුතු වේ. | ඉදිරියේ දී ගැලපීම් කිරීමට කටයුතු කරමි. |

**(ඉ) අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව 2015 වර්ෂයේ සිට අඛණ්ඩව මෙහෙයුම් ප්‍රතිඵලයේ ඌණතාවයක් වාර්තා වන බැවින් එය සභාවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අයහපත්ව බලපාන බව නිරීක්ෂණය කෙරේ. | මෙහෙයුම් ප්‍රතිඵලය යහපත්ව පවත්වා ගත යුතු වේ. | ඉදිරියේ දී ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කරමි. |

**(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(i) ලැබිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,831,131 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 03 සිට වර්ෂ 15 දක්වා කාල පරාසය ඉක්ම වූ එකතුව රු.3,276,636 ක් වූ ගිණුම් ශේෂ 08 ක් ඇතුළත් වී තිබුණි. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

**(ii) ගෙවිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.12,542,360 ක් වූ ණයහිමි ශේෂය තුළ වර්ෂ 02 සිට වර්ෂ 03 දක්වා වූ කාල පරාසය ඉක්ම වූ එකතුව රු.2,652,557 ක් වූ ශේෂ 05 ක් ඇතුළත් වී තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**(උ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,564,782 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය | සභාව විසින් තම බල ප්‍රදේශයේ ඇති දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීම කෙරෙහි තම අවධානය යොමුකර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ප්‍රදේශයේ වරිපනම් බදු අය කිරීමට තරම් දියුණු මට්ටමක නොමැති බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 570 හා 571(1)(2) | අවුරුදු 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.1,126,000 ක තැන්පතු ශේෂ 16 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,287,871 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.529,386 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 415,856 | 587,746 | 582,276 | 551,979 | 393,236 | 447,807 | 320,294 | 600,654 |
| කුලී | 4,977,000 | 1762,890 | 1,725,675 | 133,300 | 5,054,500 | 1,984,870 | 1,945,520 | 109,425 |
| බලපත්‍ර ගාස්තු | 536,425 | 537,679 | 537,679 | 8,800 | 637,625 | 585,225 | 585,225 | 8,800 |
| වෙනත් ආදායම් | 3,519,300 | 3,197,523 | 1,961,521 | 5,383,840 | 3,303,300 | 3,314,822 | 1,870,036 | 3,626,478 |
| | 9,448,581 | 6,085,838 | 4,807,151 | 6,077,919 | 9,388,661 | 6,332,724 | 4,721,075 | 4,345,357 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.10,431,195 ක් වූ අතර, අයවීම් රු.4,807,151 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 46 ක්ව පැවතුණි. | හිඟ ආදයම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයවැය ප්‍රකාරව ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

**(අ) අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයකර ගතයුතු වූ මුළු ආදායම රු.66,239 ක් වුවද, වර්ෂය තුළ රැස් කිරීම් රු.3,046 ක් හෙවත් සියයට 4.5 ක් වීමෙන් අක්කර බදු අය කිරීම දුර්වල තත්ත්වයක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකිරීමට කටයුතු කරමි. |

**(ආ)** **බදු දීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ මුළු බදු ආදායම රු.6,334,160 ක් විය. වර්ෂයේ රැස් කළ ආදායම රු.635,970 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් අයවීම් මුළු ආදායමින් සියයට 10 ක් විය. මේ අනුව ආදායම් අයකිරිම දුර්වල තත්ත්වයක පැවතුන අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(ආ) උපවගන්තිය ප්‍රකාර කටයුතු කර, හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකිරීමට කටයුතු කරමි. |

**2.2.4 කුලී ආදායම**

**කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ මුළු කඩ කුලී ආදායම රු.147,590 න් වර්ෂය තුළ රැස් කිරීම් රු.58,375 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 40 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකිරීමට කටයුතු කරමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,405,707 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.3,978,133 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතහැර දැමූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ව්‍යාපෘති 02 ක් සඳහා රු.1,500,000 ක් අනුමත කර තිබුණ ද, එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ සැලසුම්ගත කර්මාන්ත ඉටුකළ යුතු වේ. | ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) සභාව විසින් වසර 03 කට පෙර නිරවුල් අයිතියක් නොමැති ඉඩමක රු.1,683,125 ක මුදලක් වැයකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වෙනුවෙන් ගොඩනැගිලි ඉදිකර තිබුණි. කෙසේ වුවද, මෙම ඉදිකිරීම් 2017 ඇති වූ ගංවතුර සමඟ සම්පූර්ණයෙන්ම විනාශ වීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. | කසළ කළමනාකරණය සඳහා දිගුකාලීන සැලැස්මක් ඉදිරියේදී ක්‍රියාත්මක කරමි. |
| (ii) 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනය මගින් කැළි කසළ ඉවත් කිරීම, එක් රැස් කිරීම, ප්‍රවාහනය අත්‍යාවශ්‍ය සේවාවක් බවට පත්කර තිබූ අතර, ඒ සඳහා වෙනම ඒකකයක් පිහිටුවා දිගුකාලීන සැලැස්මක් සකස් කළයුතු බව පෙන්වා දී තිබුණ ද, එවැනි වැඩපිළිවෙලකට සභාව අවතීර්ණ වී නොතිබුණි. | කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. | කසළ කළමනාකරණය සඳහා දිගුකාලීන සැලැස්මක් ඉදිරියේදී ක්‍රියාත්මක කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.58,069,162 ක් වැයකර ඉදිකරන ලද ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල හා සතිපොල ගොඩනැගිල්ල පිහිටි ඉඩම්වල අයිතිය නිරවුල් කරගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 12 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 04 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවේ සේවය කර මියගිය, විශ්‍රාම ගිය, වෙනත් ආයතනයකට මාරු වී ගිය හා සේවය හැර ගිය සේවකයින් 16 දෙනෙකුගේ එකතුව රු.120,988 ක හිඟ සේවක ණය | හිඟ ණය ශේෂ අයකර ගත යුතු වේ. | හිඟ ණය ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

ශේෂයක් හා 2018 මාර්තු සේවය අත්හිට වූ නිලධාරියකුගෙන් රු.150,670 ක ණය ශේෂයක් 2019 අප්‍රේල් 01 දින දක්වාම අයකර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජූලි 30 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් රු.102,290 ක් වටිනා පරිගණක හා උපාංග කට්ටල 02 ක් සභාවට ලබා දී තිබුණු නමුත්, ලැබීම් නියෝග නිකුත් කර සභාවේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර තිබුණේ එක් පරිගණක හා උපාංග කට්ටලයක් පමණි. | සභාව වෙත ලැබුණු ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනගත කළ යුතු වේ. | සභාපති වෙනුවෙන් සම්බන්ධීකරණ ලේකම්තුමාගේ නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කරමි. |

### 3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ රු.999,990 කට මිලදී ගත් විදුලි උත්පාදක යන්ත්‍රයක් 2017 මැයි මස ඇති වූ ගං වතුර නිසා අක්‍රීය වී තිබුණි. එය අළුත්වැඩියාව සඳහා 2018 අගෝස්තු 30 දින ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් වෙත යොමු කර තිබුණි. | ටෙන්ඩර් පරිපාටියට අනුගතව අළුත්වැඩියා කටයුතු සඳහා යොමුකළ යුතු වේ. | ලිඛිත ලියවිලි ඉදිරිපත් කිරීමකින් තොරව අඩු මුදලකට අළුත්වැඩියා කටයුතු සඳහා මෙම ආයතනයට රැගෙන ගොස් භාර දුන් අතර වහාම අළුත්වැඩියා කර, ලබා ගැනීමට කටයුතු කරමි. |

**3.4.3 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධාවනයෙන් ඉවත්කර තිබූ කැබ් රථයක් 2016 මැයි 07 දින සිට ද, ට්‍රැක්ටර් රථයක් 2017 මැයි 12 දින සිට ද සභා භූමිය තුළ ගාල් කර තිබුණි. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදුකළ යුතු වේ. | සභාව සතුව අරමුදල් නොමැති බැවින් අළුත්වැඩියා කිරීමට නොහැකි විය. |

**3.4.4 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 සහ 2015 යන වර්ෂ වලදී සභාවට ලබා දී තිබුණු රු.45,577,614 ක වටිනාකමින් යුත් වාහන 07 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට ලද වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පවරා ගැනීමේ දී දැරීමට සිදුවන වියදම් සඳහා ප්‍රතිපාදන සහා අරමුදලේ නොමැත. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 06 ක රු.7,999,544 ක් වූ ඉතිරිවීම් තිබූ අතර, එම වටිනාකම් සියයට 21 සිට සියයට 89 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |
| (ආ) | එක් වියදම් විෂයයක අහිතකර විචලනය රු.2,090,959 ක් හෙවත් සියයට 85 ක් විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.19,618,027 ක් වූ අතර, එම වටිනාකම සියයට 23 සිට සියයට 80 දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |
| (ආ) | මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩ සටහන පිළියෙල කිරීමේ දී විගණකාධිපතිගෙන් විමසීම් කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ කමිටුව එක් වරක් පමණක් රැස් වී තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | වර්ෂය සඳහා එක් වරක් පමණක් රැස් වූ අතර, ඉදිරියේ දී නියමිත පරිදි කටයුතු කරමි. |